**මාධ්‍ය නිවේදනය**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2022(2023)**

2022(2023) - අ.පො.ස. (සා.පෙළ) විභාගය 2023 මැයි මස 29 වන දින සිට ජූනි මස 08 වන දින දක්වා විභාග මධ්‍යස්ථාන 3568 ක දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

- පාසල් අයදුම්කරුවන්ගේ විභාග ප්‍රවේශ පත්‍ර හා කාල සටහන් අදාළ විදුහල්පතිවරුන් වෙත ද පෞද්ගලික අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර ඔවුන් තම අයදුම්පතෙහි සඳහන් කර ඇති ලිපිනයටද 2023.05.15 දින සිට තැපැල් මගින් යොමු කර ඇත.
- විභාග ප්‍රවේශ පත්‍ර නොලද පාසල් විභාග අපේක්ෂකයන්ගේ ප්‍රවේශ පත්‍ර පාසල් ප්‍රධානීන් වෙත ද, පෞද්ගලික විභාග අපේක්ෂකයන්ගේ ප්‍රවේශ පත්‍ර අදාළ අයදුම්කරු වෙත ද බාගත කිරීමේ අවස්ථාව 2023.05.18 දින සිට ලබා දේ. මේ සඳහා විභාග දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය වන www.doenets.lk භාවිත කළ යුතුය.
- ප්‍රවේශ පත්‍රයේ ඉල්ලුම් කර ඇති විෂයයන්හි, මාධ්‍යයෙහි, ජාතික හැඳුනුම්පත් අංකයෙහි, උපන්දිනය සහ නමෙහි යම් වෙනසක් ඇත්නම් හෝ අලුතින් විෂයයක් ඇතුළත් කළ යුතු නම් එම සංශෝධන https://onlineexams.gov.lk/eic වෙබ් අඩවිය වෙත පිවිස මාර්ගගතව සිදුකර ගැනීම සඳහා මැයි මස 24 වන දින මධ්‍යම රාත්‍රී 12.00 දක්වා අවස්ථාව සලසා ඇත.
- ඒ අනුව, පාසල් අයදුම්කරුවන් තම විදුහල්පති මගින් ද පෞද්ගලික අයදුම්කරුවන් තමා විසින්මද අදාළ සංශෝධන සිදුකළ යුතුය.
- මෙම විභාගයට අදාළ කාල සටහන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ (www.doenets.lk) පළ කර ඇති බව ද විභාග අපේක්ෂකයන් ඇතුළු මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.


**විමසීම්**

| | |
|---|---|
| ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ක්ෂණික ඇමතුම් අංකය | : 1911 |
| පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව | : 0112784208/ 0112784537<br>0112785922/ 0112786616 |